සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

4 වන මහල, සෙත්සිරිපාය, 1වන අදියර, බත්තරමුල්ල.
4 வது மாடி,செத்சிறிபாய, 1 ம் கட்டம், பத்தரமுல்ல
4th floor, Sethsiripaya, 1st Stage, Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/SW/15/08/සමII

ඔබේ අංකය / உமது இல / Your No: ......................................

දිනය / திகதி / Date: 2016.11.09

සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,

**සමෘද්ධි ප්‍රතිලාභී සහ අඩු ආදායම්ලාභී පවුල් තොරතුරු යාවත්කාලීන කිරීමේ සමීක්ෂණයේ දත්ත පරිගණකගත කිරීම කඩිනම් කිරීම**

පියවර දෙකකින් සිදු කරනු ලැබූ මෙම සමීක්ෂණයේ දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය තුල සමීක්ෂණයට භාජනය වූ සම්පූර්ණ පවුල් සංඛ්‍යාව 2,380,480 ක් පමණ වේ. මෙම සමීක්ෂණයේ දත්ත පත්‍රිකා පරිගණකගත කර ඉන් අනතුරුව තෝරාගත් නිර්ණායක අනුගමනය කරමින් සුදුසු ප්‍රතිලාභීන් තෝරාගෙන කැබිනට් මණ්ඩල අනුමැතියට අනුව 2017 ජනවාරි මස සිට නව සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කල යුතුව ඇත.

02. මේ වන විටත් මෙම වැඩසටහනේ ඇති වැදගත්කම ඔබ හොඳින් අවබෝධකරගෙන ඇති හෙයින් සමීක්ෂණයේ දත්ත පරිගණකගත කිරීමේ වැඩසටහන කඩිනම් කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිත උපදෙස් සෘජුවම ඔබ වෙත ලබා දී ඇත.

03. එහෙත් දෛනික දත්ත ඇතුලත් කිරීමේ ප්‍රගතිය විශ්ලේෂණය කිරිමේ දී පෙනී යන්නේ මේ වන විටත් දිස්ත්‍රික් මට්ටමින් ලබා ඇති ප්‍රගතිය කිසි සේත් ප්‍රමාණවත් නොවන බවයි. එක් සමීක්ෂණ දත්ත පත්‍රිකාවක් පරිගණක ගත කිරීම සඳහා රු.20/- බැගින් ලබා දී පරිගණක දැනුම ඇති බාහිර පාර්ශවයන් යොදා ගෙන මෙකී ක්‍රියාවලිය කඩිනම් කිරීමට සහ නිශ්චිත කාලයක් තුල එනම් 2016.11.30 දිනට පෙර මෙම කාර්යය නිම කිරීමට උපදෙස් ලබා දී ඇති බව නැවත නැවතත් සිහිපත් කරමි. ඒ අනුව මෙම කාලසීමාව දීර්ඝ කිරීමට කිසිසේත් අදහස් නොකෙරේ.

04. තව ද මගේ සමාංක හා 2016.10.27 දිනැති උපදෙස් මාලාවේ සඳහන් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමුකර 2016.11.30 දිනට පෙර එකී කාර්යය අවසන් කරන මෙන් වැඩි දුරටත් දන්වා සිටිමි. මෙම සමීක්ෂණ පත්‍රිකා පරිගණකගත කිරීමේ දී එක් එක් දිස්ත්‍රික් වලට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සීමාවන් ගණනය කර ඉල්ලීම් කල යුතු අතර මේ වන විට පරිගණකගත කරන ලද සමීක්ෂණ දත්ත පත්‍රිකා පදනම් කරගෙන ඊට අවශ්‍ය මුදල් ඉල්ලුම් කිරීම ද කඩිනමින් සිදු කල යුතු වේ.

නීල් හපුහින්න,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්: -

01. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්- කා.දැ.ගැ.ස හා අ.ක.ස.
02. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - සමීක්ෂණ දත්ත පරිගණකගත කිරීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා.
03. සියළුම මූලස්ථාන කළමණාකරුවන් - සමීක්ෂණ දත්ත පරිගණකගත කිරීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා.


| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமைபதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமைபதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722**(Hotline) |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |